# සිංහල විවාහ චාරිත්‍රයන් හි පවතින සුදු පිරිවටයේ චාරිත්‍රය පිළිබඳ තරුණ තරුණියන්ගේ ආකල්ප විමසා බැලීම

අසිත මල්ලවආරච්චි[1]

ඕනෑම සමාජයක භෞතික වශයෙන් සංස්කෘතිය ඉතා වේගවත් ආකාරයෙන් වෙනස්වීම්වලට ලක් වුවත්, අභෞතික සංස්කෘතිය වෙනස් වන්නේ ඉතාමත් මන්දගාමී ස්වරූපයෙනි. චාරිත්‍රයන් හි චාරිත්‍ර, අගනාකම්, සාරධර්ම, ආකල්ප ආදිය පරම්පරානුගතව සමාජය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සිංහල චාරිත්‍ර වාරිත්‍ර අතර තවමත් අවිච්ඡින්නව පවතින එක් චාරිත්‍රයක් වන්නේ විවාහ චාරිත්‍රයන් හී පවතින සුදුපිරුවටයේ චාරිත්‍රයයි. ලිංගිකත්වය පිළිබඳව ලාංකීය සමාජය තුළ ප්‍රසිද්ධියේ කතා නොකළත්, විවාහවන යුවතියගේ කන්‍යාභාවය පරීක්ෂා කරනු ලබන්නේ විවෘත වේදිකාවක ය. කන්‍යාභාවයේ විද්‍යාත්මක පැතිකඩ පිළිබඳව තරුණ ප්‍රජාව කෙතරම් දැනුවත් වුවත්, සුදුපිරුවටය පිළිබඳ සමාජ ආකල්ප විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ජීව විද්‍යාත්මක වශයෙන් එතරම් සැලකිල්ලට භාජනය නොවන මෙම චාරිත්‍රය, සමාජය තුළ මෙතරම් වටිනාකම් සමුදායක් අරක්ගෙන සිටින්නේ ඇයිද? යන්න විමසා බැලීම ද, මෙම අධ්‍යයනයෙන් සිදු කරන ලදි.

මා විසින් තොරාගන්නා ලද පර්යේෂණ ගැටලුව වූයේ, කන්‍යාභාවය පිළිබඳ ජීව විද්‍යාත්මක පදනම පිළිගත්තත්, විවාහ චාරිත්‍රයන් හි පවතින සුදු පිරුවටයේ චාරිත්‍රයට අනුගත වීමට තරුණ ප්‍රජාව කැමැත්තක් දක්වනවාද? යන්නයි. පර්යේෂණ ගැටලුවට අදළව ගොඩනගා ගන්නා ලද උපන්‍යාසය වූයේ, සිංහල විවාහ චාරිත්‍රයන් හි පවතින සුදු පිරුවටයේ චාරිත්‍රයට අනුගත වන්නේ, සංස්කෘතික බලපෑමක් පදනම් කරගෙන ය යන්නයි. මෙහිදි පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගත් අතර දත්ත රැස් කිරිම සඳහා ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගත්තේ ය. එහිදි නියැදිය ලෙස කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ආචාර්යයවරුන් ඇතුළුව 100 දෙනෙක් සසම්භාවී නියැදි ක්‍රමයේ අහඹු නියැදි රටාවට තෝරා ගනිමින් ඔවුන් වෙත ප්‍රශ්න මාලාව ඉදිරිපත් කර, ඔවුන් සම්මුඛ සාකච්ඡාවට බඳුන් කළේ ය.

මෙම අධ්‍යයනය තුළින් ලබාගන්නා ලද පොදු නිගමනය වන්නේ සුදුපිරුවටයේ චාරිත්‍රයට අනුගත වීමේදි කාන්තා පාර්ශවය සංස්කෘතික පදනමක් මත අනුගත වන අතර පුරුෂ පාර්ශ්වය එයින් මානසික තෘප්තියක් ලබන බවයි. නමුත් එය ප්‍රකාශ කිරිමට පෙළඹෙන්නේ ඉතාමත් සීමිත පිරිසක් පමණක් බව මෙම පර්යේෂණයෙන් ගම්‍ය විය.

**මූඛ්‍ය පද** - කන්‍යාභාවය, සුදු පිරුවටය, අභෞතික සංස්කෘතිය